IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019
(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2021 අගෝස්තු, සැප්තැම්බර්)

BLE 205 - කම්කරු නීතිය

අයදුම්කරුවන්ට උපදෙස් :

1) මුළු ලකුණු **100** යි.

2) මෙම ප්‍රශ්න පත්‍රය **ප්‍රශ්න අට (08) කින්** සහ **පිටු දෙකකින් (02) කින්** සමන්විත වේ.

3) **ඕනෑම ප්‍රශ්න පහ (05) කට පමණක්** පිළිතුරු සැපයිය යුතු වේ.

4) කාලය **පැය තුන (03) යි.**

5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාග ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. ජාත්‍යන්තර ප්‍රමිතීන්ගේ රැකවරණය ද සහිතව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කම්කරු නීති ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප ආශ්‍රිතව ශ්‍රමය සපයන ශ්‍රමික ජනතාවගේ සුරක්ෂිතභාවය උදෙසා ප්‍රමාණවත් ද? ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රමිකයන්ගේ නෛතික තත්වය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් උක්ත ප්‍රකාශය පිළිබඳව විමර්ශනාත්මකව අදහස් දක්වන්න.

(ලකුණු 20)

2. (අ) ශ්‍රී ලංකාවේ රැකියා පරිසරය තුළ ආධුනිකයා (පුහුණුවන්නා) ගේ නෛතික තත්වය කෙසේද?

(ලකුණු 10)

(ආ) පරිවාසිකයකුගේ සේවය අවසන් කිරීමකදී සේවා යෝජක ඒ පිළිබඳව හේතු දැක්වීමට බැඳී සිටීද?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

3. අධිකරණ ක්‍රියාදාමය තුළ කලින් කලට විනිශ්චය වූ නඩු තීන්දු මඟින් නිර්මාණය වූ පරීක්ෂණ, රැකියා ගිවිසුමක "සේවකයා" හඳුනා ගැනීම විෂයෙහි කෙසේ ක්‍රියාත්මක වී තිබේද? විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

4. "විෂමාචාර ක්‍රියාවක් මත සේවකයකුගේ සේවය අවසන් කළ හැකි ද යන්න පිළිබඳව අධිකරණය විසින් විනිශ්චිත නඩු තීන්දු මඟින් කලින් කලට මාර්ගෝපදේශ සපයා ඇත." විනිශ්චිත නඩු තීරණ ඇසුරෙන් මෙම ප්‍රකාශය තහවුරු කරන්න.

(ලකුණු 20)

5. "ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ජාත්‍යන්තර නීති ප්‍රතිපාදන වල දායකත්වය ද සහිතව ශ්‍රී ලංකාවේ දේශීය නීති පද්ධතිය තුළ ද විශාල නීති ප්‍රමාණයක් ක්‍රියාත්මක වේ. එහෙත් සෑම අවදානම් සහගත තත්ත්වයකින්ම ළමයා සුරක්ෂිත ද යන්න විවෘත සංවාදයකට තුඩු දුන් කරුණකි." ජාත්‍යන්තර නීති සහ ශ්‍රී ලංකාවේ දේශීය නීති ප්‍රතිපාදන කෙරෙහි ද අවදානය යොමු කරමින් උක්ත ප්‍රකාශය පිළිබඳව විවේචනාත්මකව විමර්ශනය කරන්න.

(ලකුණු 20)

6. "ශිෂ්ට සම්පන්න රැකියා පරිසරයක් බිහි කිරීම, කම්කරු අයිතිවාසිකම් නගා සිටුවීම යන අරමුණු පෙරදැරි කරගෙන වර්ෂ 1919 වෙසයිල්ස් සම්මුතිය (සාම සම්මුතිය) හරහා ස්ථාපිත වූ අන්තර්ජාතික කම්කරු සංවිධානය පුරා අවුරුදු සියයකට වඩා වැඩි කාලයක් තිස්සේ මේ වන විටත් සක්‍රියව ක්‍රියාත්මක වෙමින් පවතී." අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සාමාජික රටක් ලෙසට ශ්‍රී ලංකාව සහ අන්තර් ජාතික කම්කරු සංවිධානය අතර පවතින සම්බන්ධතාවය කෙරෙහි ද අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශය පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

7. "ශ්‍රී ලංකාවේ රැකියා පරිසරය තුළ ශ්‍රමය සපයන කම්කරු ජනතාවගේ රැකියාව අසාධාරණ සහ අයුක්ති සහගත ලෙස අවසන් කිරීම වැළැක්වීම උදෙසා 1971 අංක 45 දරණ සේවකයින්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධි විධාන) පනත අද දවසේත් සංශෝධන සහිතව ක්‍රියාත්මක වේ." 1971 අංක 45 දරණ සේවකයින්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධි විධාන) පනතේ ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු කෙරෙහි ද අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය පිළිබඳව කරුණු දක්වන්න.

(ලකුණු 20)

8. (අ) තාවකාලික සේවකයකු ලෙස හෝ අනියම් සේවකයකු ලෙස සේවයට පැමිණෙන ශ්‍රමිකයකුට ස්ථිර සේවකයකුගේ සේවා තත්ත්වය ඉල්ලා සිටිය හැකිද ?

(ලකුණු 10)

(ආ) නිශ්චිත කාලීන සේවා ගිවිසුමක් අවසන් වීම මත කම්කරු විනිශ්චය සභාවකින් සහන ඉල්ලා සිටිය හැකිද ?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

******

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2021 අගෝස්තු, සැප්තැම්බර්)

BLE 206 - ශ්‍රී ලංකාවේ ශ්‍රම භාවිතයේ ඓතිහාසික පැතිමාන

අයදුම්කරුවන්ට උපදෙස්

(01) **ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු එකකින් (01) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

01. රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීම සහ නිරිත දිගට සංක්‍රමණය වීම කෙරෙහි බලපෑ හේතු සාධක සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

02. ආගම බිහිවීම කෙරහේ බලපෑ හේතු සාධක සාකච්ඡා කර වර්තමාන මිනිසාගේ දෛනික ජීවිතයට ආගම බලපෑම් කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

03. කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ කෙරෙහි බලපෑ මූලික හේතු මොනවාදැයි පැහැදිලි කොට, එමඟින් සිදුවූ සමාජීය වෙනස්කම් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. යුරෝපීය ජාතීන් විසින් හඳුන්වාදුන් වැවිලි ආර්ථිකය මඟින් ශ්‍රී ලංකා දේශපාලනයට සහ ආර්ථිකයට කරන ලද බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. "සංස්කෘතික විසරණ ක්‍රියාවලිය හරහා 'සමජාතීය සංස්කෘතියක්' ලෝකය තුළ බිහි වේ." මෙම ප්‍රකාශනය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

06. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයට අවධානය යොමු කරමින් ලංකාවේ දුම්රිය සහ මහාමාර්ග සංවර්ධනය සහ එහි අරමුණු විමසන්න.

(ලකුණු 20)

07. බටහිර ජාතීන්ගේ පැමිණීම නිසා 19 වන සියවසේ සිදුවූ සාමාජීය, ආර්ථික සහ සංස්කෘතික වෙනස්කම් පිළිබඳ සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

08. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

- i. රාජකාරි ක්‍රමය
- ii. විවාහය සහ ඥාතීත්වය
- iii. ශ්‍රී ලංකාවේ වතු කම්කරුවන්
- iv. කාන්තාවගේ සමාජ තත්ත්වය
- v. සමාජ සමූහ
- vi. තත්ත්වය සහ කාර්යභාරය

(ලකුණු 20)

****

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2021 අගෝස්තු, සැප්තැම්බර්)

BLE 207(a) - වාණිජ නීතිය

අයදුම්කරුවන්ට උපදෙස්

(01) **ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු පිළිතුර තුළ අඩංගු විය යුතුය.

(05) අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(07) ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(08) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

01. පහත සිදුවීම ආශ්‍රයෙන් ලබා දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

සමන් සිය සුරතල් බලු පැටියා නැති වූ බවට දැන්වීමක් පලකරන අතර, බලු පැටියා සොයා දෙන්නෙකුට රුපියල් 25000/- ක මුදලක් ලබා දෙන බව දැන්වීමේ දක්වා සිටී. කමල් විසින් බලු පැටියා සොයා ගන්නා අතර, බලු පැටියා භාරදීම සඳහා රුපියල් 35000/- ක මුදලක් ඉල්ලා සිටී. සමන් එය ප්‍රතික්ෂේප කරන අතර, පසුව කමල් රුපියල් 25000/- ක මුදලක් ලබා ගෙන බලු පැටියා ලබා දීමට එකඟ වේ.

අ) වලංගු ගිවිසුමක් යන්න පහදා දී වලංගු ගිවිසුමක් ඇති වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යයතා පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) ඉහත සිද්දිමය සාධක අනුව වලංගු අර්පනයක් හා ප්‍රතිග්‍රහණයක් සිදුවී තිබේද? ඔබේ පිළිතුර නඩු තීන්දු නීතිය මගින් පහදන්න.

(ලකුණු 10)

02. ගිවිසුම් නීතිය ඇසුරෙන් පහත සඳහන් කරුණු පැහැදිලි කරන්න.

අ) කොන්දේසි (Conditions) හා ප්‍රතිඥා භාර (Warranty)

(ලකුණු 05)

ආ) සාධාරණ හේතුව (justa causa) හා අගනා ප්‍රතිශ්ඨාව (Valuable Consideration)

(ලකුණු 05)

ඇ) වගකීමෙන් මුක්ත වීමේ වගන්ති (Exclusion Clauses)

(ලකුණු 05)

ඈ) පොදු වැරදීම (Common Mistake)

(ලකුණු 05)

03. "භාණ්ඩ මිලට ගැනීමේදී 'ගැණුම්කරු ප්‍රවේශම් වෙනු' (caveat emptor) යන්න පොදු නියමය වුවත්, 1896 අංක 11 දරන භාණ්ඩ විකිණීමේ ආඥා පනත මගින් හඳුන්වා දී ඇති ව්‍යංග කොන්දේසි මේ සඳහා ව්‍යතිරේක සපයයි."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් තහවුරු කරමින් විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 20)

04. 1896 අංක 11 දරන භාණ්ඩ විකිණීමේ ආඥා පනත මගින්, නිශ්චිත භාණ්ඩවල හිමිකම (Property in the goods) මාරු වීම සම්බන්ධයෙන් පනවා ඇති රීති පිළිබඳව ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 20)

05.

ඇ) නියෝජ්‍යත්ව සම්බන්දයක් යන්න නියෝජ්‍යයත්ව නීතිය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) අපරානුමිත කිරීම හරහා නියෝජ්‍යත්ව සම්බන්දයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය කොන්දේසි මොනවද යන්න විග්‍රහ කරන්න. ඔබේ පිළිතුර විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් තහවුරු කල යුතු වේ.

(ලකුණු 15)

06.

අ) විනිමය බිල් පතක් යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 05)

ආ) යථා පරිදි දරන්නා (Holder in due course) යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 05)

ඇ) රේඛණය කළ චෙක් පතක් සම්බන්දයෙන් එක්රැස් කිරීමේ බැංකුවක් (Collecting bank) හා ගෙවීමේ බැංකුවක් (Paying bank) සතු ව්‍යවස්ථාමය වගකීම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

07.

අ) සමාගම් නීතිය යටතේ එන 'සොලමන් මූලධර්මය' (Salomon Principle) පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික සමාගමක් සංස්ථාපනය කිරීමේදී අනුගමනය කළ යුතු පියවර සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 10)

08. පහත සඳහන් මාතෘකා ඇසුරෙන් ඕනෑම 04 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(එක් කොටසකට ලකුණු 05 බැගින් හිමිවේ.)

ඇ) රේඛණය කළ චෙක් පත් (Crossed Checks)

ආ) ඒක පාර්ශවීය අර්පණ (Unilateral Offers)

ඇ) නොසැලකිලිමත් අවනිදේශනය (Negligent Misrepresentation)

ඈ) උත්තර්ජනය (Duress)

ඉ) අත්‍යාවශ්‍යතාවයේ නියෝජ්‍යත්වය (Agency of Necessity)

ඊ) අසාධාරණ ගිවිසුම් නියම (Unfair Contractual Terms)

****

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2021 අගෝස්තු, සැප්තැම්බර්)

BLE 207(b) - පිරිවැයකරණය සහ විගණනය

අයදුම්කරුවන්ට උපදෙස්

(01) **ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු හයකින් (06) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

01.

(අ) සීමිත සුමිත්‍ර නිෂ්පාදන ආයතනයේ 2021 ජූලි මාසයට අදාලව ඇස්තමේන්තු කර තිබූ පොදු කාර්යය පිරිවැය සහ වෙනත් අදාල තොරතුරු කිහිපයක් පහත පරිදි වේ.

කම්හල් පොදුකාර්ය පිරිවැය	රු : 128,000
සෘජු ශ්‍රම පිරිවැය	රු : 79,360
සෘජු ශ්‍රම පැය	2,400
යන්ත්‍ර පැය	3,200

ඉහත තොරතුරු ආශ්‍රයෙන්

i. සෘජු ශ්‍රම පැය පදනම, යන්ත්‍ර පැය පදනම සහ සෘජු ශ්‍රම පිරිවැය පදනම මත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතිකයන් ගණනය කරන්න.

(ලකුණු 03)

ii. මෙම ආයතනය ජූලි මාසය තුළ නිෂ්පාදනය කල කාර්ය අංක 105 අදාලව සාරාංශකල තොරතුරු පහත දැක්වේ.

සෘජු ද්‍රව්‍ය පිරිවැය	රු : 380/-
සෘජු ශ්‍රම පිරිවැය	රු : 425/-
සෘජු ශ්‍රම පැය	02
යන්ත්‍ර පැය	06

ඉහත අංක (i) යටතේ ගනන් බැලූ පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ පදනම් උපයෝගී කර ගනිමින් කාර්ය අංක 105 මුළු පිරිවැය එකී එකිනෙක පදනම යටතේ වෙන වෙනම ගනන් බලන්න.

(ලකුණු 05)

(ආ) සුමිත්‍ර නිෂ්පාදකයින්ගේ ප්‍රධාන නිෂ්පාදන වර්ග දෙකක් වන "A" සහ "B" භාණ්ඩ සමාන ක්‍රියාවලින් තුළින් නිෂ්පාදනය කරයි. ඊට අදාල සාරාංශගත තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

	A	B
නිෂ්පාදිත ඒකක	5,000	8,500
ඒකකයකට අවශ්‍ය යන්ත්‍ර පැය	3	2
යන්ත්‍ර සූදානම් කිරීම්	10	15
සකස් කල ඇනවුම් ගණන	7	15

කාලපරිච්ඡේදය තුල දැරූ පොදු කාර්ය පිරිවැය පහත පරිදි වේ.

යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව පිරිවැය	රු :	240,000
යන්ත්‍ර සූදානම් කිරීම සම්බන්ධ පිරිවැය	රු :	42,000
ඇනවුම් සම්බන්ධ පිරිවැය	රු :	34,100
	රු :	316,100

ක්‍රියාකාරකම් පදනම්ව පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රමය (Activity Based Costing) මත "A" හා "B" භාණ්ඩවලට අදාල පොදුකාර්ය පිරිවැය ගනන් බලන්න.

(ලකුණු 08)

(ආ) සමූහ වශයෙන් නිෂ්පාදනය කරන භාණ්ඩයක ඇස්තමේන්තු ගත වාර්ෂික නිෂ්පාදනය ඒකක 24000 කි.

එක් සමූහයක් සඳහා යන්ත්‍ර සූදානම් කිරීමේ පිරිවැය	රු : 400/-
එක් ඒකකයක් වර්ෂයක් ගබඩාවේ රඳවාගැනීම් පිරිවැය	රු : 1.20

එක් නිෂ්පාදනයක සමූහයක අන්තර්ගත විය යුතු (නිෂ්පාදනය කල යුතු) ඒකක ප්‍රමාණය කොපමණද?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

02.

(අ) ටොරින්ටන් ටැක්සි සංගමය ටැක්සි 10 ධාවනයේ යොදවා ඇත. ඊට අදාලව සාරාංශ ගත තොරතුරු පහත දැක්වේ.

	(රු.)
ටැක්සියක පිරිවැය	400,000
කළමනාකරුගේ මාසික වැටුප	15,000
ගිණුම් සහායකගේ මාසික වැටුප	12,000
කාර්යාල සහායකගේ මාසික වැටුප	10,000
ටැක්සි නැවතුම්පොල බදුකුලී - මාසික	2,000
රක්ෂණ වාරිකය (ටැක්සි ඒකක වාර්ෂික)	18,000
වාර්ෂික බලපත්‍ර ගාස්තුව (ටැක්සි ඒකක වාර්ෂික)	1,200
රියදුරු වේතන - (එක් රියදුරකුට මාසිකව)	25,000

ටැක්සියක අපේක්ෂිත ධාවන ආයුකාලය 200,000 Km කි.

එක් ටැක්සියක් මාසයකට 3000 km ක් ධාවනය වන අතර ඉන් 30% මගීන් නොමැ. ධාවනය වේ. ඉන්ධන පිරිවැය එක් පෙට්‍රල් ලීටරයකින් 30 km ක් ධාවනය කලහැකි අතර පෙට්‍රල් ලීටරය රු. 140/- කි. අනිකුත් නඩත්තු වියදම් (ලිහිසි තෙල් සහ වෙනත් දෑ ඇතුලත්ව) කිලෝ මීටරයකට රු. 5/- කි. ටැක්සියක් කිලෝමීටර් එකක් ධාවනය කිරීමේ පිරිවැය ගනන් බලන්න.

(ලකුණු 10)

(ආ) නිෂ්පාදන ආයතනයක එහි පලමු ක්‍රියාවලිය සඳහා අමුද්‍රව්‍ය 12,000 kg ක් එක් කිලෝග්‍රෑමයක් රු. 1.50 බැගින් යොදවා ඇත. මීට අමතරව ක්‍රියාවලියේ සෘජු වැටුප් ලෙස රු. 6,700/- ක්ද, වෙනත් අමුද්‍රව්‍ය ලෙස රු. 2,900/- ක ද්‍රව්‍යද, පොදු කාර්ය පිරිවැය ලෙස රු. 2,470/- දරා ඇති අතර නිෂ්පාදන පුරස්කාර ලෙස ක්‍රියාවලියේ අපේක්ෂිත නිෂ්පාදනය මත ඒකකයකට ශත 50 බැගින් ද ගෙවීමට එකඟවී ඇත.

නිෂ්පාදනයේ අපේක්ෂිත සාමාන්‍ය හානිය යෙදවුම් වලින් 5% ක් වන අතර, හානිවූ ඒකකයක් ශත 0.75 බැගින් සුන්බුන් ලෙස විකිණිය හැක. ක්‍රියාවලිය අවසානයේ නිමි ඒකක 11,200 ක් දෙවන ක්‍රියාවලියට මාරුකර ඇත. පලමු ක්‍රියාවලි ගිණුම සහ අසාමාන්‍ය හානි ගිණුම පිලියෙල කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. (අ) සදුන් නිෂ්පාදකයින්ගේ ප්‍රධාන නිෂ්පාදනය ‘A’ වන අතර එම ක්‍රියාවලියේ අතුරු නිෂ්පාදන ලෙස ‘B’ සහ ‘C’ නම් වූ නිෂ්පාදන දෙකක්ද ලබාගනී. ආරම්භයේදී නිෂ්පාදනයේ බද්ධ පිරිවැය ලෙස රු. 8000/- ක පිරිවැයක් දරා ඇත. එකිනෙක නිෂ්පාදනයේ ලාභ ආන්තිකය එහි විකුණුම් මත පිලිවෙලින් 30%, 25% සහ 15% වේ. අනිකුත් පසු නිෂ්පාදන පිරිවැය පහත පරිදි වේ.

	A	B	C
අමුද්‍රව්‍ය (රු.)	100	75	25
සෘජු ශ්‍රමය (රු.)	200	125	50
පොදු කාර්ය පිරිවැය (රු.)	150	125	75
	450	325	150
විකුණුම් (රු.)	6000	4000	2500

විකුණුම් වියදම් විකුණුම් මත 3.2% ලෙස ඇස්තමේන්තු කර ඇත. බද්ධ නිෂ්පාදන පිරිවැය මෙම නිෂ්පාදන තුන (03) අතර බෙදීයන ආකාරය පෙන්වන ලේඛනයක් පිලියෙල කරන්න.

(ලකුණු 08)

(ආ) පිරිවැයකරණයේදී හානිවූ නිෂ්පාදනයන්ගේ වටිනාකම සහ සුන්බුන් වටිනාකම ගනන් බලන සහ ගිණුම්ගත කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) ඌන අන්තර්ග්‍රහණය සහ අධි අන්තර්ග්‍රහණය යන්න පැහැදිලි කොට පිරිවැය ගිණුම්කරණයේදී ඌන අන්තර්ග්‍රහණ පිරිවැය සහ අධි අන්තර්ග්‍රහණ පිරිවැය සැලකිල්ලට ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

04.

(අ) නිෂ්පාදන ආයතනයක දෛනික පදනම මත වැටුප් ගෙවන අනියම් කම්කරුවන් 120 දෙනෙක්ද, මාසික පදනම මත වැටුප් ගෙවන ස්ථිර සේවකයින් 40 දෙනෙක්ද සේවයේ යොදවා ඇත. මෙම සේවකයින්ගේ වැටුප් පිලියෙල කිරීම, වැටුප් ගෙවීම සහ ගිණුම්ගත කිරීම යන සියලු කාර්යයන් ආයතනයේ සේවකයින් තිදෙනෙකු අතර පහත පරිදි බෙදාදී ඇත.

අනිල් - සියලුම ස්ථිර සේවකයන්ගේ වැටුප් පිලියල කිරීම, ගෙවීම සහ ගිණුම් ගත කිරීම.

බැසිල් - අනියම් සේවකයින් අංක 1 – 59 දක්වා අයගේ වැටුප් පිලියල කිරීම, ගෙවීම සහ ගිණුම්ගත කිරීම

සුසිල් - අනියම් සේවකයින් අංක 60 – 120 දක්වා අයගේ වැටුප් පිලියල කිරීම, ගෙවීම සහ ගිණුම්ගත කිරීම

මෙම ආයතනයේ වැටුප් ගෙවීම් පිලිබඳව ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලනය පිලිබඳව සෑහීමට පත් නොවන ඔබගේ විගණන කාර්ය මණ්ඩල ප්‍රධානියා විසින් පහත සඳහන් කාර්යන් ඔබට පවරා ඇත.

i. ආයතනය තුල ක්‍රියාත්මක වන වැටුප් ගෙවීම් පිලිබඳව අභ්‍යන්තර පාලනය ඇගයීමට සුදුසු ප්‍රශ්නාවලියක්ද, අභ්‍යන්තර පාලනය දුර්වලනම් එය වැඩි දියුණු කිරීමට සුදුසු නිර්දේශයන්,

ii. වැටුප් ගෙවීම් පිලිබඳව ක්‍රියාත්මක වන අභ්‍යන්තර පරීක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා සුදුසු නිර්දේශයන්ද (එකිනෙක සේවකයන් අතර වැඩ බෙදීම) ඇතුලත්වන ලිපියක ආකෘතියක් පිලියල කරන්න.

(ලකුණු 10)

(ආ) වාණිජ ව්‍යාපාරික කටයුතුවල නිරතවන ශ්‍රී ලංකාවේ විශාලතම රාජ්‍ය ආයතනයක විගණන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ලෙස ඔබව පත් කර ඇත. මෙම ආයතනය දෛනිකව සැලකියයුතු ප්‍රමාණයක අත්පිට සහ ණයට ගැනුම් ගණුදෙනු කරනු ලබන බැවින් මෙම සියලු ගණුදෙනු නිවැරදිව ගිණුම්ගත වී ඇද්දැයි තහවුරු කර ගැනීම විගණනයට ප්‍රවේශයක් ලබා ගැනීමේ අත්‍යාවශ්‍ය අංගයක් බව ඔබගේ විගණන ප්‍රධානියා ඔබට දන්වා ඇත.

එහෙයින් මෙම ආයතනයේ ගැනුම් සන්නිරීක්ෂණය කිරීම සඳහා ඔබ විසින් අනුගමනය කිරීමට අපේක්ෂිත ක්‍රියාපිලිවෙල පැහැදිලි කරමින් විගණන ප්‍රධානියා වෙත යොමු කරන ලිපියක ආකෘතියක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05.

(අ) "විගණක සිය විගණිත ආයතනය සම්බන්ධයෙන් ස්වාධීන පුද්ගලයෙකු විය යුතුය." විගණකගේ ස්වාධීනත්වය ඛණ්ඩ වීමට බලපෑ හැකි කරුණු / අවස්ථාවන් කවරේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) "විශාල ප්‍රමාණයේ ව්‍යාපාරයකට විගණනය අත්‍යාවශ්‍ය වුවත්, සුළු පරිමාණ ව්‍යාපාරයකට විගණනය අත්‍යාවශ්‍ය නොවනු ඇත." කුමන පරිමාණයේ ව්‍යාපාරයකට වුවද විගණනයකින් අත්කරගත හැකි වාසි කවරේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ඇ) විගණක ඉදිරිපත් කර ඇත්තේ තත්වාගණනය කල විගණන මතයක් නම් ඊට හේතුවිය හැකි කරුණු කවරේද?

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

06.

(අ) ඔබ කිසියම් ආයතනයක විගණක ලෙස නම් කර ඇත්නම්, ඔබට එම පත්වීම භාරගත හැකිද යන්න තීරණය කිරීමේදී ඔබ විසින් සලකා බැලිය යුතු කරුණු කවරේද?

(ලකුණු 06)

(ආ) ඔබ යම් ආයතනයක විගණන කාර්ය ආරම්භ කිරීමට ප්‍රථම එය සැලසුම් කරගන්නා ආකාරයත්, එලෙස විගණනය සැලසුම් කිරීමේ ඇති වැදගත්කමත් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) මූල්‍ය තත්ව ප්‍රකාශනයක මුහුණත දැක්වෙන ශේෂයන් වන;

මෝටර් රථවාහන

බඩුතොගය

ප්‍රාග්ධන සංචිත

වෙළඳණය හිමියන්

වර්ෂය අවසානයේ සත්‍යාපනය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

****

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2021 අගෝස්තු, සැප්තැම්බර්)

BLE 208 - මූල්‍ය කළමනාකරණය

අයදුම්කරුවන්ට උපදෙස්

(01) **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතරකින් (04) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

01. අ. මූල්‍ය කළමනාකරණයේ කාර්යභාරය සහ අරමුණු පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය අතර සමාන අසමානතා විස්තර කරන්න.

(ලකුණු 10)

ඇ. මෙහෙයුම් චක්‍රය පැහැදිලි කර එහි ප්‍රයෝජනවත් භාවය විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

02. සමාගමක මූල්‍ය තොරතුරු කොටසක් පහත දැක්වේ. සියලු සංඛ්‍යා රුපියල් මිලියන වලින් දක්වා ඇත.

I. සත්‍ය විකුණුම්

ඔක්තෝබර්	240
නොවැම්බර්	280
දෙසැම්බර්	320

II. අපේක්ෂිත විකුණුම්

ජනවාරි	120
පෙබරවාරි	180
මාර්තු	180
අප්‍රේල්	240
මැයි	200
ජුනි	120
ජූලි	240

III. විකුණුම් වලින් 75% ක ප්‍රමාණයක් ණයට විකුණුම්ය. ණයට විකුණුම් වලින් 60% ක ප්‍රමාණයක් විකුණුම් සිදු වූවාට පසු මාසයේ ලැබේ. තවත් 30% ක් මාස දෙකකින්ද 10% ක් මාස තුනකින්ද ලැබේ.

IV. සමාගම විකුණුම් වලින් 20% ක ලාභ ප්‍රතිශතයක් උපයාගනී.

V. සියලු ගැණුම් ණයට සිදුකරන අතර ගැනුම් සිදුකර මාසයකින් මුදල් ගෙවීම සිදු වේ.

VI. සමාගමේ අපේක්ෂිත මෙහෙයුම් වියදම් පහත පරිදිය.

ජනවාරි	24
පෙබරවාරි	32
මාර්තු	40

අප්‍රේල්	40
මැයි	32
ජුනි	28

VII. රුපියල් මිලියන 100 ක් වන ණයකර සඳහා නියමිත 12% පොලියෙන් 25%ඉක් මාර්තු මාසයේ ගෙවිය යුතුය.

VIII. රුපියල් මිලියන 20 ක බදු අත්තිකාරම් ගෙවීමක් අප්‍රේල් මාසයේ කළ යුතුය.

IX. ජුනි මාසයේ රුපියල් මිලියන 24 ක යන්ත්‍ර මිලට ගැනීමට සැලසුම් කර ඇත.

X. දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත මුදල් ශේෂය රුපියල් මිලියන 80 කි.

XI. සෑම මසකම ආරම්භක මුදල් ශේෂය රුපියල් මිලියන 80ක් විය යුතු අතර සත්‍ය ශේෂය එයට අඩුනම් එම හිගය ණය මුදලක් ලෙස පෙන්විය යුතුය. මුදල් අතිරික්තයක් ලැබෙන අවස්ථාවල එම හිග මුදල් හෝ ඉන් කොටසක් ගෙවිය යුතුය.

XII. මාසික ගොඩනැගිලි කුලිය රුපියල් මිලියන 160 කි.

මෙම තොරතුරු ආශ්‍රයෙන් ජනවාරි සිට ජුනි දක්වා කාලයට මුදල් අයවැය ලේඛණයක් පිළියෙල කරන්න.

(මුළු ලකුණු 25)

03. අ. තොග පාලන ආකෘතිය රූපසටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. නිෂ්පාදන ආයතනයකට අවශ්‍ය අමුද්‍රව්‍ය තොග වර්ගයන් පිළිබඳ පහත සඳහන් තොරතුරු සපයා ඇත.

වාර්ෂික භාවිතය ඒකක 5000

ඇණවුම් පිරිවැය රු. 2500/-

තොග ඒකකයක් තබා ගැනීමේ පිරිවැය රු. 50/-

පොරොත්තු කාලය දින 15

දිනක සාමාන්‍ය භාවිතය ඒකක 10

ආරක්ෂිත තොගයේ කාලය දින 15

මෙම තොරතුරු ආශ්‍රයෙන් පහත සඳහන් ගණනය කිරීම් කරන්න.

I. ආර්ථික ඇණවුම් ප්‍රමාණය

II. ආරක්ෂිත තොගය

III. නැවත ඇණවුම් මට්ටම

IV. උපරිම තොගය

(ලකුණු 10)

ඇ. වර්ථමාන ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ණයට විකිණීම කෙරෙහි බලපාන හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඈ. වෙළඳ ණය සම්බන්ධ පිරිවැය වර්ග විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 25)

04. අ. ව්‍යාපෘතියක මූලික ආයෝජන පිරිවැය රුපියල් මිලියන 30 කි. ව්‍යාපෘතියේ ජීව කාලය වසර 06 ක් වන අතර මුදල් ගලා ඒම් පිළිවෙලින් පහත පරිදිය.

වසර	මුදල් ප්‍රවාහය රුපියල් මිලියන
1	10
2	9
3	8.2
4	6
5	4.5
6	3.7

ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය ගණනය කරන්න.

(ලකුණු 05)

ආ. විදුලි බල නිෂ්පාදන සමාගමක් සූර්ය තාපයෙන් විදුලිය නිපදවිය හැකි ආයෝජන ව්‍යාපෘතියක් සලකා බලමින් සිටී. එහි තොරතුරු පහත දැක්වේ.

මූලික ආයෝජන පිරිවැය රුපියල් මිලියන 1000.

ව්‍යාපෘතියේ අපේක්ෂිත ජීව කාලය වසර 25.

අපේක්ෂිත වාර්ෂික ආදායම රුපියල් මිලියන 170.

15 වසර අපේක්ෂිත අලුත්වැඩියා පිරිවැය රුපියල් මිලියන 200.

10% මට්ටම් සාධකය යටතේ ශුද්ධ වර්ථමාන වටිනාකම සහ අභ්‍යන්තර ඉපයුම් ඵලදා අනුපාතය ගණනය කරන්න.

(ලකුණු 20)

(මුළු ලකුණු 25)

****

Table C: Present Value Factor of a Lump Sum (PVF) of ₹1

Year	Interest Rate													
	1%	2%	3%	4%	5%	6%	7%	8%	9%	10%	11%	12%	13%	14%
1	0.990	0.980	0.971	0.962	0.952	0.943	0.935	0.926	0.917	0.909	0.901	0.893	0.885	0.877
2	0.980	0.961	0.943	0.925	0.907	0.890	0.873	0.857	0.842	0.826	0.812	0.797	0.783	0.769
3	0.971	0.942	0.915	0.889	0.864	0.840	0.816	0.794	0.772	0.751	0.731	0.712	0.693	0.675
4	0.961	0.924	0.888	0.855	0.823	0.792	0.763	0.735	0.708	0.683	0.659	0.636	0.613	0.592
5	0.951	0.906	0.863	0.822	0.784	0.747	0.713	0.681	0.650	0.621	0.593	0.567	0.543	0.519
6	0.942	0.888	0.837	0.790	0.746	0.705	0.666	0.630	0.596	0.564	0.535	0.507	0.480	0.456
7	0.933	0.871	0.813	0.760	0.711	0.665	0.623	0.583	0.547	0.513	0.482	0.452	0.425	0.400
8	0.923	0.853	0.789	0.731	0.677	0.627	0.582	0.540	0.502	0.467	0.434	0.404	0.376	0.351
9	0.914	0.837	0.766	0.703	0.645	0.592	0.544	0.500	0.460	0.424	0.391	0.361	0.333	0.308
10	0.905	0.820	0.744	0.676	0.614	0.558	0.508	0.463	0.422	0.386	0.352	0.322	0.295	0.270
11	0.896	0.804	0.722	0.650	0.585	0.527	0.475	0.429	0.388	0.350	0.317	0.287	0.261	0.237
12	0.887	0.788	0.701	0.625	0.557	0.497	0.444	0.397	0.356	0.319	0.286	0.257	0.231	0.208
13	0.879	0.773	0.681	0.601	0.530	0.469	0.415	0.368	0.326	0.290	0.258	0.229	0.204	0.182
14	0.870	0.758	0.661	0.577	0.505	0.442	0.388	0.340	0.299	0.263	0.232	0.205	0.181	0.160
15	0.861	0.743	0.642	0.555	0.481	0.417	0.362	0.315	0.275	0.239	0.209	0.183	0.160	0.140
16	0.853	0.728	0.623	0.534	0.458	0.394	0.339	0.292	0.252	0.218	0.188	0.163	0.141	0.123
17	0.844	0.714	0.605	0.513	0.436	0.371	0.317	0.270	0.231	0.198	0.170	0.146	0.125	0.108
18	0.836	0.700	0.587	0.494	0.416	0.350	0.296	0.250	0.212	0.180	0.153	0.130	0.111	0.095
19	0.828	0.686	0.570	0.475	0.396	0.331	0.277	0.232	0.194	0.164	0.138	0.116	0.098	0.083
20	0.820	0.673	0.554	0.456	0.377	0.312	0.258	0.215	0.178	0.149	0.124	0.104	0.087	0.073
25	0.780	0.610	0.478	0.375	0.295	0.233	0.184	0.146	0.116	0.092	0.074	0.059	0.047	0.038
30	0.742	0.552	0.412	0.308	0.231	0.174	0.131	0.099	0.075	0.057	0.044	0.033	0.026	0.020
40	0.672	0.453	0.307	0.208	0.142	0.097	0.067	0.046	0.032	0.022	0.015	0.011	0.008	0.005
50	0.608	0.372	0.228	0.141	0.087	0.054	0.034	0.021	0.013	0.009	0.005	0.003	0.002	0.001

(Contd...)

Table C Contd.

Year	Interest Rate 15%	16%	17%	18%	19%	20%	21%	22%	23%	24%	25%	30%	40%
1	0.870	0.862	0.855	0.847	0.840	0.833	0.826	0.820	0.813	0.806	0.800	0.769	0.714
2	0.756	0.743	0.731	0.718	0.706	0.694	0.683	0.672	0.661	0.650	0.640	0.592	0.510
3	0.658	0.641	0.624	0.609	0.593	0.579	0.564	0.551	0.537	0.524	0.512	0.455	0.364
4	0.572	0.552	0.534	0.516	0.499	0.482	0.467	0.451	0.437	0.423	0.410	0.350	0.260
5	0.497	0.476	0.456	0.437	0.419	0.402	0.386	0.370	0.355	0.341	0.328	0.269	0.186
6	0.432	0.410	0.390	0.370	0.352	0.335	0.319	0.303	0.289	0.275	0.262	0.207	0.133
7	0.376	0.354	0.333	0.314	0.296	0.279	0.263	0.249	0.235	0.222	0.210	0.159	0.095
8	0.327	0.305	0.285	0.266	0.249	0.233	0.218	0.204	0.191	0.179	0.168	0.123	0.068
9	0.284	0.263	0.243	0.225	0.209	0.194	0.180	0.167	0.155	0.144	0.134	0.094	0.048
10	0.247	0.227	0.208	0.191	0.176	0.162	0.149	0.137	0.126	0.116	0.107	0.073	0.035
11	0.215	0.195	0.178	0.162	0.148	0.135	0.123	0.112	0.103	0.094	0.086	0.056	0.025
12	0.187	0.168	0.152	0.137	0.124	0.112	0.102	0.092	0.083	0.076	0.069	0.043	0.018
13	0.163	0.145	0.130	0.116	0.104	0.093	0.084	0.075	0.068	0.061	0.055	0.033	0.013
14	0.141	0.125	0.111	0.099	0.088	0.078	0.069	0.062	0.055	0.049	0.044	0.025	0.009
15	0.123	0.108	0.095	0.084	0.074	0.065	0.057	0.051	0.045	0.040	0.035	0.020	0.006
16	0.107	0.093	0.081	0.071	0.062	0.054	0.047	0.042	0.036	0.032	0.028	0.015	0.005
17	0.093	0.080	0.069	0.060	0.052	0.045	0.039	0.034	0.030	0.026	0.023	0.012	0.003
18	0.081	0.069	0.059	0.051	0.044	0.038	0.032	0.028	0.024	0.021	0.018	0.009	0.002
19	0.070	0.060	0.051	0.043	0.037	0.031	0.027	0.023	0.020	0.017	0.014	0.007	0.002
20	0.061	0.051	0.043	0.037	0.031	0.026	0.022	0.019	0.016	0.014	0.012	0.005	0.001
25	0.030	0.024	0.020	0.016	0.013	0.010	0.009	0.007	0.006	0.005	0.004	0.001	0.000
30	0.015	0.012	0.009	0.007	0.005	0.004	0.003	0.003	0.002	0.002	0.001	0.000	0.000
40	0.004	0.003	0.002	0.001	0.001	0.001	0.000	0.000	0.000	0.000	0.000	0.000	0.000
50	0.001	0.001	0.000	0.000	0.000	0.000	0.000	0.000	0.000	0.000	0.000	0.000	0.000

Table D: Present Value Factor of an Annuity (PVFA) of ₹1

Year	Interest Rate													
	1%	2%	3%	4%	5%	6%	7%	8%	9%	10%	11%	12%	13%	14%
1	0.990	0.980	0.971	0.962	0.952	0.943	0.935	0.926	0.917	0.909	0.901	0.893	0.885	0.877
2	1.970	1.942	1.913	1.886	1.859	1.833	1.808	1.783	1.759	1.736	1.713	1.690	1.668	1.647
3	2.941	2.884	2.829	2.775	2.723	2.673	2.624	2.577	2.531	2.487	2.444	2.402	2.361	2.322
4	3.902	3.808	3.717	3.630	3.546	3.465	3.387	3.312	3.240	3.170	3.102	3.037	2.974	2.914
5	4.853	4.713	4.580	4.452	4.329	4.212	4.100	3.993	3.890	3.791	3.696	3.605	3.517	3.433
6	5.795	5.601	5.417	5.242	5.076	4.917	4.767	4.623	4.486	4.355	4.231	4.111	3.998	3.889
7	6.728	6.472	6.230	6.002	5.786	5.582	5.389	5.206	5.033	4.868	4.712	4.564	4.423	4.288
8	7.652	7.325	7.020	6.733	6.463	6.210	5.971	5.747	5.535	5.335	5.146	4.968	4.799	4.639
9	8.566	8.162	7.786	7.435	7.108	6.802	6.515	6.247	5.995	5.759	5.537	5.328	5.132	4.946
10	9.471	8.983	8.530	8.111	7.722	7.360	7.024	6.710	6.418	6.145	5.889	5.650	5.426	5.216
11	10.368	9.787	9.253	8.760	8.306	7.887	7.499	7.139	6.805	6.495	6.207	5.938	5.687	5.453
12	11.255	10.575	9.954	9.385	8.863	8.384	7.943	7.536	7.161	6.814	6.492	6.194	5.918	5.660
13	12.134	11.348	10.635	9.986	9.394	8.853	8.358	7.904	7.487	7.103	6.750	6.424	6.122	5.842
14	13.004	12.106	11.296	10.563	9.899	9.295	8.745	8.244	7.786	7.367	6.982	6.628	6.302	6.002
15	13.865	12.849	11.938	11.118	10.380	9.712	9.108	8.559	8.061	7.606	7.191	6.811	6.462	6.142
16	14.718	13.578	12.561	11.652	10.838	10.106	9.447	8.851	8.313	7.824	7.379	6.974	6.604	6.265
17	15.562	14.292	13.166	12.166	11.274	10.477	9.763	9.122	8.544	8.022	7.549	7.120	6.729	6.373
18	16.398	14.992	13.754	12.659	11.690	10.828	10.059	9.372	8.756	8.201	7.702	7.250	6.840	6.467
19	17.226	15.678	14.324	13.134	12.085	11.158	10.336	9.604	8.950	8.365	7.839	7.366	6.938	6.550
20	18.046	16.351	14.877	13.590	12.462	11.470	10.594	9.818	9.129	8.514	7.963	7.469	7.025	6.623
25	22.023	19.523	17.413	15.622	14.094	12.783	11.654	10.675	9.823	9.077	8.422	7.843	7.330	6.873
30	25.808	22.396	19.600	17.292	15.372	13.765	12.409	11.258	10.274	9.427	8.694	8.055	7.496	7.003
40	32.835	27.355	23.115	19.793	17.159	15.046	13.332	11.925	10.757	9.779	8.951	8.244	7.634	7.105
50	39.196	31.424	25.730	21.482	18.256	15.762	13.801	12.233	10.962	9.915	9.042	8.304	7.675	7.133

(Contd...)

Table D Contd.

Year	15%	16%	17%	18%	19%	20%	21%	22%	23%	24%	25%	30%	40%
	Interest Rate												
1	0.870	0.862	0.855	0.847	0.840	0.833	0.826	0.820	0.813	0.806	0.800	0.769	0.714
2	1.626	1.605	1.585	1.566	1.547	1.528	1.509	1.492	1.474	1.457	1.440	1.361	1.224
3	2.283	2.246	2.210	2.174	2.140	2.106	2.074	2.042	2.011	1.981	1.952	1.816	1.589
4	2.855	2.798	2.743	2.690	2.639	2.589	2.540	2.494	2.448	2.404	2.362	2.166	1.849
5	3.352	3.274	3.199	3.127	3.058	2.991	2.926	2.864	2.803	2.745	2.689	2.436	2.035
6	3.784	3.685	3.589	3.498	3.410	3.326	3.245	3.167	3.092	3.020	2.951	2.643	2.168
7	4.160	4.039	3.922	3.812	3.706	3.605	3.508	3.416	3.327	3.242	3.161	2.802	2.263
8	4.487	4.344	4.207	4.078	3.954	3.837	3.726	3.619	3.518	3.421	3.329	2.925	2.331
9	4.772	4.607	4.451	4.303	4.163	4.031	3.905	3.786	3.673	3.566	3.463	3.019	2.379
10	5.019	4.833	4.659	4.494	4.339	4.192	4.054	3.923	3.799	3.682	3.571	3.092	2.414
11	5.234	5.029	4.836	4.656	4.486	4.327	4.177	4.035	3.902	3.776	3.656	3.147	2.438
12	5.421	5.197	4.988	4.793	4.611	4.439	4.278	4.127	3.985	3.851	3.725	3.190	2.456
13	5.583	5.342	5.118	4.910	4.715	4.533	4.362	4.203	4.053	3.912	3.780	3.223	2.469
14	5.724	5.468	5.229	5.008	4.802	4.611	4.432	4.265	4.108	3.962	3.824	3.249	2.478
15	5.847	5.575	5.324	5.092	4.876	4.675	4.489	4.315	4.153	4.001	3.859	3.268	2.484
16	5.954	5.668	5.405	5.162	4.938	4.730	4.536	4.357	4.189	4.033	3.887	3.283	2.489
17	6.047	5.749	5.475	5.222	4.990	4.775	4.576	4.391	4.219	4.059	3.910	3.295	2.492
18	6.128	5.818	5.534	5.273	5.033	4.812	4.608	4.419	4.243	4.080	3.928	3.304	2.494
19	6.198	5.877	5.584	5.316	5.070	4.843	4.635	4.442	4.263	4.097	3.942	3.311	2.496
20	6.259	5.929	5.628	5.353	5.101	4.870	4.657	4.460	4.279	4.110	3.954	3.316	2.497
25	6.464	6.097	5.766	5.467	5.195	4.948	4.721	4.514	4.323	4.147	3.985	3.329	2.499
30	6.566	6.177	5.829	5.517	5.235	4.979	4.746	4.534	4.339	4.160	3.995	3.332	2.500
40	6.642	6.233	5.871	5.548	5.258	4.997	4.760	4.544	4.347	4.166	3.999	3.333	2.500
50	6.661	6.246	5.880	5.554	5.262	4.999	4.762	4.545	4.348	4.167	4.000	3.333	2.500